# වැඩි

# අස්වනු ලබාදෙන

# දෙමුහුන් නේපියර් තෘණ

# වගා කරමු



ප්‍රකාශනය
මානව සම්පත් සංවර්ධන අංශය
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ, පේරාදෙණිය.

**දෙමුහුන් නේපියර් තෘණ යනු**

උසස් තත්ත්වයේ නේපියර් තෘණ වර්ග දෙමුහුන් කර නිපදවා ඇති, වැඩි අස්වැන්නක් ලබාදෙන, ලංකාවේ බොහෝ ප්‍රදේශ සඳහා යෝග්‍ය (නුවරඑළිය වැනි ශීත ප්‍රදේශ හැර), කිරි ගවයින් සඳහා සුදුසු කපාගෙන රැගෙනවිත් කෑමට දියහැකි, පෝෂ ගුණයෙන් ඉහළ තෘණ වර්ගයි.



CO - 3



CO - 4



පැච්චෝන් - 1



CO - 5





සාම්පූර්නා

## බිම් සැකසීම

වර්ෂා කාලය ආරම්භයත් සමඟ බිම් සකස් කර ක්ෂේත්‍රය සකසා ගත යුතුය. ඒ සඳහා ක්‍රම දෙකකි.

### 01 වලවල් වල සිටුවීම




පේළි අතර හා පැළ අතර පරතරය 1m ×1m වන ලෙස අඩි 1×1×1 වලවල් සකස් කර එක් වලක දඬු කැබලි 2 බැගින් සිටුවන්න.

අක්කර 1 ට අවශ්‍ය දඬු ප්‍රමාණය = 8000 පමණ

### 02 කාණු වල සිටුවීම

මීටර 1 පරතරයට අඩි 1 පළල කාණු සකස් කර කාණු තුළ අඩි 2 පරතරයට එක් ස්ථානයක එක් දඬු කැබැල්ලක් ලෙස සිටුවන්න. (බැකෝ යන්ත්‍රයක් භාවිතයෙන් කාණු සැකසීම කළ හැක)

අක්කර 1 කට අවශ්‍ය දඬු ප්‍රමාණය = 6000 පමණ


## රෝපණ ද්‍රව්‍ය

මධ්‍යම ප්‍රමාණයට මේරූ ගැට 2ක් සහිත නැවුම් දඬු කැබලි හෝ මුල් සහිත කඳ කොටස් විය යුතු ය.

### දඬු කැබලි



පහත රූප සටහනේ ඇති ආකාරයට එක් ගැටයක් පස තුළට සිටින සේ හා අනෙක් ගැටය පස හා ස්පර්ශ වන ලෙස සිටුවන්න.




### මුල් සහිත කඳ කොටස්



## වැඩි තෘණ අස්වැන්නක් සඳහා තිබිය යුතු තත්ත්ව

- දවසේ වැඩි කාලයක් තුළ හොඳින් හිරු එළිය ලැබීම
- පාංශු කාබනික ද්‍රව්‍ය බහුල පසක් තිබීම
- පාංශු තෙතමනය ප්‍රශස්ථ මට්ටමින් පැවතීම
- හොඳින් ජල වහනය සිදුවන පසක් තිබීම

## පොහොර යෙදීම

### • කාබනික පොහොර පමණක් ක්ෂේත්‍රයට යොදනවා නම්

**භාවිත කල හැකි කාබනික පොහොර වර්ග**

- හොඳින් දිරූ ගොම පොහොර
- කුකුල් අතුරණුව
- දිරූ එළු පොහොර
- කොම්පෝස්ට් පොහොර

- බිම් සැකසීමේදී එක් වලකට කාබනික පොහොර 1½ - 2 kg පමණ යොදන්න.
  ( අක්කර 1 කට 6000 - 8000 kg)

- පසුව වසරකට වාර 2-3 ක් පමණ පැළයකට කාබනික පොහොර 1 kg බැගින් යොදන්න.
  (අක්කර 1 කට 4000 kg)

- එහෙත් පාංශු තත්ත්වය හා කාබනික පොහොර වර්ගය මත යොදන වාර ගණන වෙනස් විය හැක.

- ඒ අනුව වගාවේ වර්ධනය හා අස්වැන්න නිරීක්ෂණය කර කාබනික පොහොර යොදන වාර ගණන තීරණය කරන්න.

**සෑම කැපුමකටම පසු පඳුර වටා කාබනික පොහොර මිශ්‍ර කර පස් ලං කිරීමෙන් දීර්ඝ කාලයක් (වසර 2 - 2½) හොඳින් අස්වැන්න ලබා ගත හැක.**

### • රසායනික පොහොර යෙදීම

රසායනික පොහොර ක්ෂේත්‍රයට යෙදීමට පෙර ඔබගේ පස පරීක්ෂා කර උපදෙස් ලබාගන්න.

**(ගන්නෝරුව පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය මඟින් පස් පරීක්ෂා කිරීම හා අවශ්‍ය උපදෙස් ලබාගත හැක)**

## සම්මත පොහොර මිශ්‍රණය

| | | අක්කර එකකට kg | පැළයකට |
|---|---|---|---|
| බිම් සැකසීමේදී | කාබනික පොහොර | 6,000 | 1.5kg |
| සිටුවා දින 7-10 ට පසු | යූරියා | 40 | 10g |
| | ට්‍රිපල් සුපර් පොස්පේට්/TSP | 80 | 20g |
| | මියුරේට් ඔෆ් පොටෑෂ් /MOP | 60 | 15g |
| සෑම කැපුමකට පසුව | යූරියා | 40 | 10g |

**ඉහත පොහොර මිශ්‍රණය වාර්ෂික නිර්දේශයක් වන අතර සෑම වසරකට ම පසු පස බුරුල් කර වගාව අළුත් කර මෙම සම්මත පොහොර නිර්දේශය ම යොදන්න.**

## ජල සම්පාදනය

මෝසම් වර්ෂාව ආරම්භයත් සමඟ දඬු සිටුවීම සිදු කරන්න. දඬු කැබලි හොඳින් පැල වූ පසු වර්ෂාව නොමැති කාල වලදී දින 4-5 කට වරක් ජලය සැපයීම සිදු කරන්න.

## වල් මර්දනය

පැළ කුඩා කාලයේ දී උදැල්ලෙන් වල් පැළ ගලවා පස් පැළයට ලං කරන්න. තෘණ හොඳින් වර්ධනය වූ පසු වල් පැළ ඇතිවීම ඉතා අඩුය.

## අස්වැන්න ලබාගැනීම

පළමු අස්වැන්න සිටුවා දින 60 කින් ද පසුව සෑම දින 45-60 කට වරක් ම අස්වැන්න නෙළිය හැක. මෙහි දී පොළව මට්ටමට ආසන්නයෙන් එනම් අඟල් 2-3 උසින් තෘණ කැපීම සිදු කිරීමෙන් නැවත වර්ධනය හොඳින් සිදු වේ. ප්‍රශස්ථ තත්ත්ව යටතේ එක් කැපුමක දී පඳුරකින් අමු තෘණ 5 kg ක දළ අස්වැන්නක් ලබා ගත හැක.

## දින 45 - 60 අතර අස්වැන්න නෙළාගත් දෙමුහුන් නේපියර් තෘණ වගාවකින් ලබාගත හැකි පෝෂණ අගයන්

| අඩංගු ද්‍රව්‍ය | | ප්‍රමාණය |
|---|---|---|
| වියළි ද්‍රව්‍ය | Dry Matter | 18 - 20% |
| දළ ප්‍රෝටීන | Crude Protein | 12 -16% |
| දළ තන්තු | Crude Fiber | 34 - 37% |
| පරිවෘත්තීය ශක්තිය | Metabolic Energy | 9.5 -10.5 MJ / kg |
| උදාසීන ඩිටර්ජන්ට් ෆයිබර් | NDF (Neutral Detergent Fiber) | 65 - 75% |

## තෘණ දඬු ලබාගත හැකි ස්ථාන

- පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය - ගන්නෝරුව
- පොලොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය
- ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය
- තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානය
- කරඳගොල්ල මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය
- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සතු පහත සඳහන් ගොවිපළ

- ✓ උඩුගොඩ ස. පා. පුහුණු මධ්‍යස්ථානය - සබරගමුව පළාත
- ✓ කොටදෙණියාව පුහුණු මධ්‍යස්ථානය - බස්නාහිර පළාත
- ✓ වන්නිගම ගොවිපළ - වයඹ පළාත
- ✓ තිරප්පනේ ගොවිපළ - උතුරු මැද පළාත
- ✓ කැකුණදුර ගොවිපළ - දකුණු පළාත
- ✓ බොරලන්ද ගොවිපළ - ඌව පළාත
- ✓ උප්පුවේලි ගොවිපළ - නැගෙනහිර පළාත
- ✓ අනිච්චියන්කුලම් ගොවිපළ - උතුරු පළාත

**වැඩි විස්තර සඳහා**

**ඔබ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලය අමතන්න.**

**සත්ත්ව අභිජනන අංශය**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**
**ගැටඹේ, පේරාදෙණිය.**
**දුරකථන අංක / 081 - 2388462 / 081 - 2388120 / දිගුව - 414**